රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 21/2009(1)

මගේ අංකය : EST 5/2/16(II)
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2010.01.06

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

## රජයේ සේවකයින්ට හා රජයේ විශ්‍රාමිකයින්ට <u>ගෙවනු ලබන ජීවන වියදම් දීමනාව වැඩිකිරීම</u>

**ඉහත මැයෙන් 2009.12.11 දතමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2009 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.**

**02. ඒ අනුව, රජයේ සේවකයින් සඳහා 2009.11.01 දින සිට වැඩි කරන ලද ජීවන වියදම් දීමනාවේ 2009 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදල මුදල් (රු.750 x 2) 2010 ජනවාරි මස 08 වන දින ගෙවීමට භාණ්ඩාගාරය මගින් සැලසුම් කර ඇති බව දන්වා ඇත. ඒ අනුව ගෙවීම් කිරීමට අවශ්‍ය පියවර ගන්නේ නම් මැනවි.**

**03. 2010 ජනවාරි මාසයට නියමිත රු. 5250/- ක් වන ජීවන වියදම් දීමනාව 2010 ජනවාරි මස වැටුප සමග ගෙවීමට ක්‍රියා කළයුතු බව ද වැඩිදුරටත් දන්වමි.**

**04. විශ්‍රාමිකයින් සඳහා 2009 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදල, වැඩිකරන ලද ජීවන වියදම් දීමනාව සහ 2010 ජනවාරි මාසයට අදල ජීවන වියදම් දීමනාව (රු.375 x 3) 2010 ජනවාරි මස විශ්‍රාම වැටුපට සමග ගෙවීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරනු ලැබේ. ඒ අනුව, විශ්‍රාමිකයකුගේ 2009 නොවැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන ජීවන වියදම් දීමනාව රු.2375/- ක් වනු ඇත.**

ඩී.දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය